# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජුනි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජුනි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 48.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත

[සහතිකය සටහන් කළේ 2024 ජූනි මස 18 වන දින]

එල්. ඩී.— ඕ. 66/2023

**රාජ්‍ය ණය ගැනීම, නිකුත් කිරීම සහ රාජ්‍ය ණය සේවාකරණය, ඇපකර නිකුත් කිරීම, උපණය දීම, සැපයුම්කරුගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් ඇති කර ගැනීම ඇතුළුව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම පිණිස බලය ලබා දීම පිණිස ද; රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය*

**1.** (1) මේ පනත 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) නියමිත දිනය, මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස හයක කාලසීමාවකට පසු නොවන දිනයක් විය යුතු ය.

*මේ පනත අදාළ වීම*

**2.** මේ පනත පහත දැක්වෙන අස්ථිත්ව සඳහා අදාළ විය යුතු ය:-

(අ) ආණ්ඩුවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ විශේෂ වියදම් ඒකක;

(ආ) පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව රජයේ මුදල් වෙන්කර ඇති ව්‍යවස්ථාපිත අරමුදල් සහ භාර;

(ඇ) රාජ්‍ය ව්‍යවසායන්;

(ඈ) පළාත් සභා, පළාත් සභා යටතට ගැනෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන සහ පළාත් පාලන ආයතන; සහ

(ඉ) වෙනත් යම් අස්ථිත්වයක්.

රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු

**3.** රාජ්‍ය ණය කළමනාකරණය යනු පහත දැක්වෙන අරමුණු ඇතිව, රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා මධ්‍යකාලීන සිට දිගුකාලීන දක්වා වන කාලය සඳහා උපායමාර්ගයක් ඇති කොට ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වන්නේ ය:-

(අ) මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ ණය ගෙවීමේ වගකීම් කාලානුරූපීව පියවීම;

(ආ) මධ්‍යකාලීන සිට දිගුකාලීන දක්වා වන කාලය තුළ විචක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුකූලව හැකිතාක් අවම පිරිවැයක් යටතේ ණය ගැනීම; සහ

(ඇ) දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

## I වන කොටස

### රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම

ශ්‍රී ලංකා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීම

**4.** මුදල් අමාත්‍යාංශය තුළ-

(අ) ආණ්ඩුවේ ණය කළමනාකරණය කිරීම;

(ආ) ණය ඇපකර නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඇ) උපණය දීමේ මෙහෙයුම් කළමනාකරණය කිරීම; සහ

(ඈ) රාජ්‍ය ණය වාර්තාගත කිරීම සහ වාර්තා කිරීම,

සඳහා වගකීම දැරිය යුතු (මෙහි මින් මතු "කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

**5.** (1) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයකු සිටිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා කාර්යාලයේ ප්‍රධානියා විය යුතු අතර, කාර්යාලයේ සමස්ත මෙහෙයුම් කටයුතු සඳහා වගකීම දරනු ලැබිය යුතු ය.

(3) කාර්යාලයේ සියලු සේවානියුක්තයන්ගේ පාරිශ්‍රමික ඇතුළු සේවා නියුක්ති නියම සහ කොන්දේසි, කලින් කල, අදාළ විය හැකි පරිදි වූ, ආණ්ඩුවේ පවත්නා නියෝග මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය

**6.** කාර්යාලය විසින්, 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:-

(අ) (i) මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය;

(ii) වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම; සහ

(iii) ආණ්ඩුවේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වන වෙන්දේසි දින දර්ශනය,

පිළියෙල කොට පළ කිරීම;

(ආ) ආණ්ඩුවේ දේශීය සහ විදේශීය ණයට ගැනීම්, අනෙකුත් ණය විධිවිධාන සැලසීම් සහ ණය කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍යමය නියම සහ කොන්දේසි පිළිබඳ සම්මුති සාකච්ඡා පැවැත්වීම සහ ක්‍රියාත්මක කිරීම:

එසේ වුව ද, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජ්‍යායතනවලින් කරනු ලබන ආණ්ඩුවේ විදේශීය ණය ගැනීම් භාණ්ඩාගාරයේ විදේශීය සම්පත් විෂයය භාර දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වී ක්‍රියාත්මක කළ යුතු ය;

(ඇ) මූල්‍ය වෙළඳපොළවල් සඳහා ප්‍රවේශය ලබා ගැනීම සහ එහි ප්‍රවේශය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි සම්බන්ධතා පවත්වා ගැනීම;

(ඈ) භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර මෙහෙයුම් විෂයය භාර දෙපාර්තමේන්තුව සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය සම්බන්ධයෙන් වන ණය මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(ඉ) ණය හා සම්බන්ධ වගකීම් කළමනාකරණ මෙහෙයුම් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(ඊ) ණය ඇපකර සහ උපණය දීමේ මෙහෙයුම්වල ණය අවදානම තක්සේරු කිරීම සඳහා සහ ඒවායේ අවදානම අවම කිරීමේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් උපදෙස් දීම;

(උ) මේ පනතට අනුකූලව, රාජ්‍ය ණය, ණය ඇපකර, උපණය, සැපයුම්කරුගේ ණය සහ මූල්‍ය කල්බදු වාර්තාගත කිරීම, වාර්තා කිරීම, ප්‍රචාරණය කිරීම සහ පළ කිරීම;

(උ) මේ පනතට අනුකූලව, කාලීනව ආණ්ඩුවේ ණය සේවාකරණය සිදු කිරීම;

(එ) ආණ්ඩුවේ පවත්නා ණය සහ පුරෝකථනය කළ ණය යන ණය දෙවර්ගය ම මත පදනම්ව ණය සේවාකරණය සම්බන්ධ පුරෝකථන සකස් කිරීම; සහ

(ඒ) මේ පනතේ 3 වන වගන්තිය යටතේ වන අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අමාත්‍යවරයා විසින් පවරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍යයක්.

මාර්ගෝපදේශ හෝ විධාන නිකුත් කිරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල

**7.** අමාත්‍යවරයා විසින්, කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ ද, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ලිඛිත මාර්ගෝපදේශ හෝ විධාන, කාර්යාලය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව

රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුව පිහිටුවීම

**8.** (1) ප්‍රතිපත්ති මට්ටමේ දී සම්බන්ධීකරණය කිරීම සඳහා-

(අ) සභාපතිවරයා වශයෙන් කටයුතු කළ යුතු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන්;

(ආ) භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර මෙහෙයුම් විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඇ) භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඈ) භාණ්ඩාගාරයේ විදේශ සම්පත් විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඉ) භාණ්ඩාගාරයේ ජාතික අයවැය විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඊ) භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය විෂයය භාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(උ) මහ බැංකු අධිපතිවරයා විසින් නම් කරනු ලබන, අධ්‍යක්ෂවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන මහ බැංකුවේ නිලධරයන් දෙදෙනෙකුගෙන්; සහ

(ඌ) කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්,

සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවක් විය යුතු ය.

(2) කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කිරීම සඳහා, කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු නම් කරනු ලැබිය යුතු ය.

(3) කමිටුව, යටත් පිරිසෙයින්, සෑම මාසයකට ම එක් වරක්වත් රැස්විය යුතු ය.

**9.** කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:- කමිටුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

(අ) ණය කළමනාකරණ උපායමාර්ගය සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූල බවට සහතික කර ගනිමින් කාර්යාලය විසින් පිළියෙල කරනු ලබන ණය කළමනාකරණ උපායමාර්ගය සහ එහි යාවත්කාලීන කිරීම් සමාලෝචනය කොට, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම;

(ආ) වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සහ එහි කාර්යසාධනය සමාලෝචනය කොට, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම;

(ඇ) දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන් සමාලෝචනය කොට, රාජ්‍ය ණය හා සම්බන්ධ වූ අවදානම පිළිබඳව සහ වෙළඳපොළේ ඇති අවස්ථා සහ නිල සංවර්ධන සහයෝගීතාව පිළිබඳ නිර්දේශ ලබා දීම; සහ

(ඈ) 3 වන වගන්තිය යටතේ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් කමිටුව වෙත පවරනු ලැබිය හැකි වෙනත් කර්තව්‍ය ඉටු කිරීම.

**10.** (1) කමිටුවේ ගණපූරණය, සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය. කමිටුවේ ගණපූරණය සහ රැස්වීම්

(2) කමිටුවේ රැස්වීමක් පහත දැක්වෙන දෙයාකාරයෙන් එක් ආකාරයකින් පවත්වනු ලැබිය හැකි ය:-

(අ) ගණපූරණයක් සංස්ථාපනය වන සාමාජිකයන් සංඛ්‍යාව රැස්වීම සඳහා නියම කරනු ලැබූ ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්වීම මගින්; හෝ

(ආ) සහභාගි වන සහ ගණපූරණයක් සංස්ථාපනය වන සියලු සාමාජිකයන්ට, රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ දී, ඊට සහභාගි වන සෑම සාමාජිකයකු ම එකවර දැක ගැනීමට සහ ඔවුන්ට සවන්දීමට හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන මාර්ගයන් මගින්.

III වන කොටස

**ආණ්ඩුව විසින් ණය ගැනීම සහ ණය කළමනාකරණය කිරීම**

ණය කළමනාකරණ උපායමාර්ගය

11\. (1) 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කාර්යාලය විසින්, ආණ්ඩුවේ ණය කළමනාකරණය කිරීම සඳහා (මෙහි මින් මතු "උපායමාර්ගය" යනුවෙන් සඳහන් කරනු ලබන) මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක්, වාර්ෂිකව අනුගාමී වසර පහක කාලසීමාවක් සඳහා චක්‍රීයව සකස් කොට වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

(2) එකී උපායමාර්ගය අමාත්‍යවරයා විසින් සමාලෝචනය කොට, අවසාන අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ප්‍රදානය කිරීමට පෙර උපායමාර්ගයේ කෙටුම්පත සම්බන්ධයෙන් ලිඛිත අදහස් දැක්වීම සඳහා මහ බැංකුවට අවස්ථාවක් ලබා දිය යුතු ය.

(3) අනුමත උපායමාර්ගය, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලව සකස් කොට මුදල් අමාත්‍යාංශයේ සහ කාර්යාලයේ නිල වෙබ් අඩවිවල පළ කරනු ලැබිය යුතු අතර, උපායමාර්ගය පිළියෙල කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද එකී වර්ෂයේ විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමට පසු නොවන දිනයක දී වාර්ෂික අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කරනු ලබන ලේඛනයක් වශයෙන්, පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) 3 වන වගන්තිය යටතේ වන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ අඛණ්ඩ අවුරුදු පහක කාලසීමාවක් සඳහා සකස් කරන ලද සහ වාර්ෂිකව යාවත්කාලීන කරන ලද උපායමාර්ගය, ඉදිරි මුදල් වර්ෂය සහ පසුව එළඹෙන මුදල් වර්ෂ හතර සමන්විත වන අතර, ඒ සඳහා පහත කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) වර්තමාන රාජ්‍ය ණය කළඹ සම්බන්ධ පිරිවැය සහ අවදානම සහ නොපිය වූ ව්‍යුත්පන්න ගනුදෙනු;

(ආ) ඉදිරි ණය ගැනීමේ අවශ්‍යතා;

(ඇ) මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව;

(ඈ) වෙළඳපොළ තත්ත්වයන්; සහ

(ඉ) උපායමාර්ගය සකස් කිරීමට අදාළ විය හැකි වෙනත් යම් සාධක.

(5) අනුමත උපායමාර්ගය කාර්යාලය විසින් අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කොට යාවත්කාලීන කරනු ලැබිය යුතු ය. යාවත්කාලීන කරන ලද උපායමාර්ගයක් අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු එය මුදල් අමාත්‍යාංශයේ සහ කාර්යාලයේ නිල වෙබ් අඩවිවල පළ කරනු ලැබිය යුතු ය.

(6) සියලු ණය ගැනීම් සහ වෙනත් ණය කළමනාකරණ මෙහෙයුම් උපායමාර්ගයට අනුකූල විය යුතු ය.

ණය ගැනීම් සඳහා බලය දීම

**12.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් ණය ගැනීමේ සහ ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ පරම අධිකාරය අමාත්‍යවරයා සතු වන්නේ ය.

(2) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ණය, ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු ය.

ණය ගැනීමේ අරමුණු

**13.** (1) ආණ්ඩුව විසින්-

(අ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ වාර්ෂික අයවැයේ යම් හිඟයක් මූල්‍යනය කිරීම;

(ආ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මට්ටමකට හෝ පරාසයකට ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් සකස් කොට පවත්වාගෙන යාම ඇතුළු මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම;

(ඇ) පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට, රාජ්‍ය ව්‍යවසායවලට සහ පාර්ලිමේන්තුව විසින් අනුමත වෙනත් යම් අස්තිත්වයකට අරමුදල් ණයට දීම;

(ඈ) කැඳවීමට ලක් වූ ආණ්ඩුවේ ඇපකර යටතේ වන බැඳීම් ඉටු කිරීම;

(ඉ) කල්පිරීමේ දිනයට පෙරාතුව ණය මුදලක් හෝ ණයක් නැවත ගෙවීම සහ ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ප්‍රති මිල දී ගැනීම ඇතුළු ගෙවීමට නියමිත ආණ්ඩුවේ ණය ප්‍රතිමූල්‍යනය කිරීම;

(ඊ) තත් කාර්ය සඳහා බලපවත්නා රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ නීතියක් යටතේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාව යටතේ වන අවිනිශ්චිත අවස්ථා සලකා අරමුදලේ විධිවිධාන සලසා ඇති පරිදි, වීරමොං පටිපාටිය හරහා හෝ වාර්ෂික අයවැය සංචිතවලින් හෝ වාර්ෂික අයවැය සඳහා වර්ෂය තුළ ගැලපුම් සකස් කිරීම සඳහා වන වෙනත් සමාන යාන්ත්‍රණවලින් සිදු කරන මුදල් වෙන් කිරීමක් හරහා අතිරේක වියදම් සඳහා අරමුදල් සැපයීම කළ නොහැකි අවස්ථාවන්හි දී ව්‍යසනකාරී හදිසි අවස්ථාවක් හේතුවෙන් ඇති වන අනපේක්ෂිත අවස්ථාවල බලපෑම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 වන ව්‍යවස්ථාවේ (3) වන සහ (4) වන ඡේද යටතේ ඇති විය හැකි ඕනෑම වියදමක් සඳහා මුදල් යෙදවීම;

(ඌ) ශ්‍රී ලංකාවේ විදේශ ව්‍යවහාර මුදල් සංචිත ප්‍රතිපූරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට සහාය වීම සඳහා; සහ

(එ) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යයක් සඳහා,

යන අරමුණු සඳහා ණය ගැනීම් සිදු කළ හැකි වන්නේ ය.

(2) ණය ගැනීම, (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ යම් කාර්යයක් සඳහා වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් නමුත් එම ණය ගැනීම අවසන් වී වැඩකරන දින පහළොවක් ඉකුත් වීමට පෙර, එකී ණය ගැනීමට අදාළ නියමයන් හා කොන්දේසි පාර්ලිමේන්තුව වෙත දැනුම් දිය යුතු ය.

මුදල් ප්‍රතිපත්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුවේ ණය සුරැකුම්පත් නිකුත් කිරීම

**14.** (1) මහ බැංකුවේ ඉල්ලීම මත, මුදල් ප්‍රතිපත්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීමේ පරම අභිප්‍රාය සඳහා ආණ්ඩුව විසින්, ණය සුරැකුම්පත් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ දී, එම ණය සුරැකුම්පත් නිකුතුවෙන් ලත් මුදල් මහ බැංකුවේ

වියුක්ත ගිණුමක තැන්පත් කරනු ලැබිය යුතු අතර, එය එම ණය සුරැකුම්පත් මුදා ගැනීම සඳහාම පමණක් භාවිත කරනු ලැබිය යුතු ය.

(3) එකී ණය සුරැකුම්පත් නිකුත් කිරීම හේතුවෙන් ආණ්ඩුව විසින් දරන ලද යම් පිරිවැයක්, මහ බැංකුව විසින් සම්පූර්ණයෙන් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

(4) මෙම නිකුත් කිරීම් කිසිදු ණය ගැනීමේ සීමාවකට යටත් නොවිය යුතු අතර, ඒවායේ පවතින ශේෂයන් ණය තොගවල සටහන් විය යුතු අතර, 25 වන වගන්තිය යටතේ වෙනම අයිතමයක් ලෙස වාර්ෂික වාර්තාවේ සටහන් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ ණය සුරැකුම්පත් නිකුත් කිරීමට අදාළ වගකීම් සහ කාර්යපටිපාටිය, ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇති කර ගනු ලබන අවබෝධතා ගිවිසුමක් යටතේ නියම කරනු ලැබිය යුතු අතර, එය 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතු ය.

වාර්ෂික ණයට ගැනීමේ සැලැස්ම

**15.** (1) යම් දී ඇති වර්ෂයක විසර්ජන පනතට අනුව සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා එක් එක් මුදල් වර්ෂය සඳහා (මේ පනතේ "ණය ගැනීමේ සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) ණය ගැනීමේ සැලැස්මක් කාර්යාලය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. එකී ණය ගැනීමේ සැලැස්ම අවම වශයෙන් අර්ධ වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබිය යුතු ය.

(2) ණය ගැනීමේ සැලැස්ම මගින් නිශ්චිත උපායමාර්ගය, වාර්ෂික දළ ණය ගැනීමේ සීමාව සහ ආණ්ඩුව වෙනුවෙන් මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, ඊට-

(අ) වර්ෂය තුළ සැලසුම් කරන ලද ණයට ගැනීම් සහ වෙනත් ණය කළමනාකරණ මෙහෙයුම්;

(ආ) භාවිත කිරීමට නියමිත යාවත්කාල ණය උපකරණ සහ ණය ගැනීමේ මූලාශ්‍ර; සහ

(ඇ) මෙම මෙහෙයුම්වල දින වකවානු,

ඇතුළත් විය යුතු ය.

(3) ණය ගැනීමේ සැලැස්ම සහ එහි යාවත්කාලීන කිරීම්, භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන අදාළ රජයේ නියෝජ්‍යායතන විමසා පිළියෙල කරනු ලැබිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, වාර්ෂික අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කරනු ලබන ලේඛනයක් වශයෙන් ණය ගැනීමේ සැලැස්ම, විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමට පසු නොවන දිනයක දී පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අතර, ණය ගැනීමේ සැලැස්ම පිළියෙල කරනු ලබන්නේ යම් වර්ෂයක් සඳහා ද එම වර්ෂයට කලින් වූ මුදල් වර්ෂය අවසාන වන විට වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම පිළිබඳ ලේඛනය වෙන්ව පළ කිරීම සඳහා කටයුතු සැලැස්විය යුතු ය. යාවත්කාලීන කරන ලද ණය ගැනීමේ සැලැස්මක් ඇත්නම්, එය අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, මුදල් අමාත්‍යාංශයේ සහ කාර්යාලයේ නිල වෙබ් අඩවිවල පළ කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ ණය සුරැකුම්පත් දේශීය වෙළඳපොළ වෙත නිකුත් කිරීම

**16.** (1) කාර්යාලය විසින් ආණ්ඩුවේ ණය සුරැකුම්පත් දේශීය වෙළඳපොළෙහි නිකුත් කිරීම, වෙන්දේසි දින දර්ශනයට අනුකූලව වෙන්දේසියක් මගින් හෝ වෙළඳපොළ පදනම් කොටගත් වෙනත් යම් යාන්ත්‍රණයක් මගින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) වෙන්දේසි දින දර්ශනය යටතේ සැලසුම් කරන ලද පළමුවර නිකුත් කිරීමේ දිනයට අවම වශයෙන් සති දෙකකට පෙරාතුව වෙන්දේසි දින දර්ශනය මුදල් අමාත්‍යාංශයේ සහ කාර්යාලයේ නිල වෙබ් අඩවිවල පළ කරනු ලැබිය යුතු අතර, එමගින්, එය පළ කරනු ලබන දින සිට ආවර්තී පදනමින් අවම ලිත් මාස තුනක් ආවරණය විය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ නිර්දේශය මත සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ආණ්ඩුවේ ණය සුරැකුම්පත් වෙළඳපොළ පදනම් කර නොගත් යාන්ත්‍රණ මගින් දේශීය වෙළඳපොළේ නිකුත් කරනු ලැබිය හැකි ය.

ආණ්ඩුව විසින් සෘජුව ම ණය ගැනීම

**17.** අමාත්‍යවරයා විසින්, කාර්යාලයේ නිර්දේශය මත සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් නියමයන් සහ කොන්දේසි මත බැංකුවලින්, වෙනත් මූල්‍ය ආයතනවලින්, ස්වෛරී ණය දෙන්නන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ ආයතනවලින් ණය ගිවිසුම් මාර්ගයෙන් හෝ අයිරා මගින් අත්තිකාරම් ලබා ගැනීම මගින් ණය ගනු ලැබිය හැකි ය.

**18.** (1) අමාත්‍යවරයා විසින් හෝ අමාත්‍යවරයා විසින් ලිඛිතව විශේෂයෙන් බලය ලබා දෙන වෙනත් යම් තැනැත්තකු විසින්, 3 වන වගන්තියේ විධිවිධානවලට සහ උපායමාර්ගයට අනුව ආණ්ඩුව වෙනුවෙන්- වගකීම් කළමනාකරණ මෙහෙයුම්

(අ) ඵලදායී ලෙස රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවේ ණය කලඹෙහි මූල්‍ය අවදානම්වලට ආවරණයක් ලෙස, එසේ කිරීම විචක්ෂණශීලී ලෙස සලකා යොදා ගනු ලබන පොලී අනුපාතිකය හෝ විනිමය හුවමාරු හෝ වෙනත් ව්‍යුත්පන්න;

(ආ) ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ආපසු ගැනීම් සහ හුවමාරු; සහ

(ඇ) කල්පිරීමේ දිනට පෙරාතුව ණයක් කලින් ආපසු ගෙවීමේ අවස්ථාවක් පිරිනැමීම,

ඇතුළු වගකීම් කළමනාකරණ මෙහෙයුම් සිදු කළ යුතු ය.

(2) වගකීම් කළමනාකරණ මෙහෙයුම් හා සම්බන්ධ ගනුදෙනු වාර්ෂික අයවැයෙන් නියම කරන ලද යම් දළ හෝ ශුද්ධ නිකුතු සීමාවකට යටත් නොවිය යුතු අතර, එය මූල්‍ය වගකීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන අදාළ නීති ප්‍රකාර ණය ඌනකරණය කිරීමේ අරමුණට අනුකූල විය යුතු ය.

## IV වන කොටස

## ආණ්ඩුවේ ණය ඇපකර, ආණ්ඩුවේ උප-ණය දීම්, සැපයුම්කරුගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම්

**19.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය ව්‍යවසායක හෝ වෙනත් යම් අස්ථිත්වයක වගකීම්වලට අදාළව ආණ්ඩුව වෙනුවෙන් ණය ඇපකර ගාස්තු එකතු කිරීම ඇතුළුව, ණය ඇපකර නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පරම අධිකාරය අමාත්‍යවරයා සතු වන්නේ ය: ආණ්ඩුවේ ණය ඇපකර

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්, එම ණය ඇපකර නිකුත් කිරීමේ දී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) ණය ගැනුම්කරු ණය අවදානම් තක්සේරුවක් පදනම් කොටගෙන යම් මූල්‍යමය අපහසුතාවකින් යුක්ත නොවන බව;

(ආ) ණය ඇපකරය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරන බවට සලකනු ලබන බව; සහ

(ඇ) ණය ඇපකරය, මූල්‍ය වගකීම් සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ අදාළ ලිඛිත නීතියට අනුව ණය ඌනකරණය කිරීමේ අරමුණට යටත් විය යුතු ය.

(2) පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ රාජ්‍ය ව්‍යවසායන් හැර, වෙනත් යම් අස්තිත්වයක වගකීම්වලට අදාළ ණය ඇපකර නිකුත් කිරීම තවදුරටත් පාර්ලිමේන්තුවේ අනුමතයට යටත් විය යුතු ය.

(3) ණය ගැනුම්කරු ණය අවදානම් තක්සේරුවක් පදනම් කොටගෙන යම් මූල්‍ය අපහසුතාවකින් යුක්ත වන බවට සලකනු ලබන අවස්ථාවක, ඇපකරය නිකුත් කරනු නොලැබිය යුතු ය.

(4) ණය ඇපකර නිකුතුවක් අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙරාතුව, කාර්යාලය විසින්, එම ඇපකරයෙන් ආණ්ඩුවේ ණය අවදානම තක්සේරු කර මිල නියම කළ යුතු අතර, ඇපකර ගාස්තු ඇතුළු අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණය නිර්දේශ කළ යුතු ය.

(5) අවදානම් තක්සේරුවේ ප්‍රතිඵලය, තක්සේරු කිරීමේ දී යොදාගත් ක්‍රමය සහ යෝජිත අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණය අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(6) එක් එක් ණය ඇපකරය, ණය ගැණුම්කරු විසින් ලියා අත්සන් කරන ලද අදාළ නෛතික ලේඛන මගින් සනාථ කරනු ලැබිය යුතු අතර, එහි වෙනත් කරුණු අතර, කැඳවන ලද ඇපකරයක් යටතේ ගෙවන ලද යම් මුදලක් නියම කරනු ලබන පොළිය සමග ආපසු ගෙවිය යුතු බව ද, කාර්යාලය විසින් ඉල්ලා සිටින ලද යම් තොරතුරක් සම්පූර්ණ වශයෙන් හෙළිදරව් කිරීමට එකඟ වන බවට ද විධිවිධාන ඇතුළත් විය යුතු ය.

(7) ණය ගැනුම්කරු ණය ඇප ගිවිසුම යටතේ ඔහුගේ බැඳියාවන් නොසලකා හරිනු ලබන හෝ ඒ බැඳීම් සම්බන්ධයෙන් යහපත්ව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ඒ ණය ඇප ගිවිසුම යටතේ ආණ්ඩුවට අයිති යම් මුදලක් ණය ගැනුම්කරුගෙන් ආපසු අය කර ගැනීමට අවශ්‍ය ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමේ අයිතිය අමාත්‍යවරයා සතු වන්නේ ය.

**20.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආණ්ඩුවේ අරමුදල් පළාත් සභාවකට, පළාත් පාලන ආයතනයකට, රාජ්‍ය ව්‍යවසායකට හෝ වෙනත් යම් අස්ථිත්වයකට උපණය දීමේ පරම අධිකාරය අමාත්‍යවරයා සතු වන්නේය: උපණය ලබා දීම

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ එම අරමුදල් උපණය දීමේ දී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) ණය අවදානම් තක්සේරුවක් මත පදනම්ව ණය ගැනුම්කරු යම් මූල්‍ය අපහසුතාවයකින් යුක්ත නොවීම; සහ

(ආ) උපණය දීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කරනු ලබන බවට සැලකීම.

(2) පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ රාජ්‍ය ව්‍යවසායන් හැර, වෙනත් යම් අස්ථිත්වයකට උපණය දීම සම්බන්ධයෙන් වූ වගකීම් තවදුරටත් පාර්ලිමේන්තුවේ අනුමතයට යටත් විය යුතු ය.

(3) ණය ගැනුම්කරු ණය අවදානම් තක්සේරුවක් පදනම් කොටගෙන යම් මූල්‍ය අපහසුතාවයකින් යුක්ත වන බවට සලකනු ලබන අවස්ථාවක, උපණය දීමේ ගනුදෙනුව සිදු නොවිය යුතු ය.

(4) ආණ්ඩුවේ අරමුදල් උපණයට දීම අමාත්‍ය මණ්ඩලයේ අනුමතයට ඉදිරිපත් කිරීමට පෙර කාර්යාලය විසින් එම ණය මුදල ලබා දීමේ දී ආණ්ඩුවට සිදුවන ණය අවදානම තක්සේරු කර මිල නියම කළ යුතු අතර, අරමුදල් සැපයීමේ වියදම, යම් ව්‍යවහාර මුදල් අවදානමක් සහ ආණ්ඩුවට ඇති ණය අවදානම ආවරණය කිරීම සඳහා වන පොලී අනුපාතික මට්ටම නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(5) අවදානම් තක්සේරුවේ ප්‍රතිඵල, තක්සේරු කිරීමේ දී භාවිත කරන ලද ක්‍රමය සහ යෝජිත පොලී අනුපාතිකය අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) අරමුදල් සැපයීමේ වියදම, ව්‍යවහාර මුදල් අවදානම සහ රජයට ඇති ණය අවදානම ආවරණය වන පරිදි කාර්යාලයේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනුපාතයෙන් වන පොලියක්, ණය ගැනුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ය.

(7) සෑම උපණය දීමේ ගනුදෙනුවක්ම ණය ගැනුම්කරු විසින් ලියා අත්සන් කරන ලද අදාළ නෛතික ලේඛනවලින් සනාථ කරනු ලැබිය යුතු අතර, ණය ගැනුම්කරු ණය ගෙවීම නොසලකා හරින අවස්ථාවක හෝ කිසියම් ණය ගෙවීමේ බැඳියාවක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වන අවස්ථාවක, ගෙවිය යුතු දණ්ඩන පොලියට අදාළ වගන්තියක් ද ඇතුළුව, නියමිත දිනට සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි මත එහි ණය බැඳීම් ඉටු කිරීමට වන ගිවිසුමක් ඇතුළත් විය යුතු ය.

ආණ්ඩුව විසින් එළඹෙන ලද සැපයුම්කරුගේ ණය ගිවිසුම්

**21.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයාට, ආණ්ඩුව වෙනුවෙන් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන භාණ්ඩ සපයා ගැනීම හෝ ඉදිකිරීම හෝ නඩත්තු කිරීම සඳහා සැපයුම්කරුගේ ණය ගිවිසුමකට එළඹීමේ පරම අධිකාරය තිබිය යුතු ය.

(2) කාර්යාලයේ විෂයපථය යටතට ගැනෙන සැපයුම්කරුගේ ණය ගිවිසුම් නියම කරනු ලබන පරිදි විය යුතු ය. එම ගිවිසුම්වලට එළඹීමට පෙර, කාර්යාලය විසින්, එම ගිවිසුම්වලට එළඹීමේ දී ආණ්ඩුවට ඇති වන වියදම තක්සේරු කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් විශේෂයෙන් බලය ලබා දෙන යම් තැනැත්තකුට නිර්දේශ යවනු ලැබිය යුතු ය.

ආණ්ඩුව විසින් එළඹෙන මූල්‍ය කල්බදු ගිවිසුම්

**22.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයාට ආණ්ඩුව වෙනුවෙන් මූල්‍ය කල්බදු ගිවිසුම්වලට එළඹීමට පරම අධිකාරය තිබිය යුතු ය.

(2) කාර්යාලයේ විෂයපථය යටතට ගැනෙන මූල්‍ය කල්බදු ගිවිසුම් සහ එකී ගිවිසුම්වල ආකෘතිය, නියම සහ කාලය නියම කරනු ලබන පරිදි විය යුතු ය. ඒ ගිවිසුම්වලට එළඹීමට පෙර කාර්යාලය විසින් ආණ්ඩුවට ඔවුන්ගෙන් වන වියදම තක්සේරු කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයා විසින් විශේෂයෙන් බලය ලබා දෙන ලද තැනැත්තාට හෝ නිර්දේශ යවනු ලැබිය යුතු ය.

V වන කොටස

**රාජ්‍ය ණය සහ මූල්‍ය විධිවිධාන සැලසීම් වාර්තාගත කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම**

රාජ්‍ය ණය සහ මූල්‍ය විධිවිධාන සැලසීම් වාර්තාගත කිරීම

**23.** (1) කාර්යාලය විසින් සුදුසු දත්ත පද්ධතියක-

(අ) නොපිය වූ රාජ්‍ය ණය;

(ආ) සැපයුම්කරුගේ ණය ගිවිසුම්;

(ඇ) මූල්‍ය කල්බදු ගිවිසුම්;

(ඈ) ව්‍යුත්පන්න ගනුදෙනු;

(ඉ) ණය ඇපකර; සහ

(ඊ) උපණය දීමේ මෙහෙයුම්,

පිළිබඳ කාලානුරූප, විස්තරාත්මක සහ නිවැරදි දත්ත සහ තොරතුරු වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, නොපිය වූ ණය ඇපකර සහ උපණය දීම, උපණය දීම යටතට ගැනෙන ණය ආයතන සහ ඇපයකින් ආවරණය නොවූ ණය සම්බන්ධයෙන් වන දත්ත සහ තොරතුරු සහ මේ පනත යටතේ අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු 2 වන වගන්තිය යටතේ වන අස්ථිත්වයන්ගෙන් ඉල්ලා සිටීමට කාර්යාලයට බලය තිබිය යුතු ය.

රාජ්‍ය ණය සහ මූල්‍ය විධිවිධාන සැලසීම් ප්‍රකාශයට පත් කිරීම

**24.** කාර්යාලය විසින්, එක් එක් කාර්තුවේ අවසානයේ සිට දින හැටක් ඉකුත් වීමට පෙර අනෙකුත් දේ අතර-

(අ) මුළු ණය සංචිත, ණය ප්‍රවාහ, ණය සේවාකරණ පිරිවැය සහ ණය මුදා ගැනීමේ පැතිකඩ සහ ණය කලඹේ අවදානම් මිනුම් සහ ආණ්ඩුවේ යම් අලුතින් ණය ගැනීමක්;

(ආ) ව්‍යුත්පන්නවල තොරතුරු;

(ඇ) ණය ඇපකරවල තොරතුරු;

(ඈ) රාජ්‍ය ව්‍යවසායන්ගේ, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ඇපයකින් ආවරණය නොවූ ණය සංචිත එකතුව;

(ඉ) 20 වන වගන්තිය යටතේ ආණ්ඩුව විසින් සපයන ලද උපණය දීමේ පහසුකම්වල තොරතුරු;

(ඊ) 21 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුව විසින් එළඹෙන ලද සැපයුම්කරුගේ ණය ගිවිසුම් පිළිබඳ තොරතුරු;

(උ) 22 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුව විසින් එළඹෙන ලද මූල්‍ය කල්බදු ගිවිසුම් පිළිබඳ තොරතුරු;සහ

(ඌ) 14 වන වගන්තිය යටතේ මුදල් ප්‍රතිපත්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමේ කාර්ය සඳහා ණය සුරැකුම්පත් නිකුතුවල නොපිය වූ අගයයන්,

පිළිබඳ නිවැරදි සහ කාලානුරූප තොරතුරු සපයනු ලබන්නා වූ රාජ්‍ය ණය පිළිබඳ කාර්තුමය සංඛ්‍යානමය ණය ප්‍රකාශනයක් සකස් කොට පළ කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## පාර්ලිමේන්තුවට වාර්ෂිකව වාර්තා කිරීම

පාර්ලිමේන්තුවට කාර්යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

**25.** (1) කාර්යාලය විසින්, සෑම වර්ෂයක් සඳහා ම ආණ්ඩුවේ ණය ගැනීමේ සහ වෙනත් ණය කළමනාකරණ මෙහෙයුම්, නොපිය වූ රාජ්‍ය ණය, ඇපකර සහ උපණය දීමේ කටයුතු සහ පෙර මූල්‍ය වර්ෂය තුළ ආණ්ඩුව විසින් එළඹෙන ලද වෙනත් මූල්‍ය විධිවිධාන සැලසීම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු ය.

(2) වාර්ෂික වාර්තාවේ -

(අ) 11 වන වගන්තියේ සඳහන් උපායමාර්ග පිළිබඳ තොරතුරු සහ එහි තාර්කික පදනම;

(ආ) උපායමාර්ගයේ සහ ණය ගැනීමේ සැලැස්මේ දායකත්වය, 3 වන වගන්තියේ සඳහන් ණය කළමනාකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ඒවා ක්‍රියාත්මක කිරීම සහ යම් වෙනස්වීමක් සඳහා වන තාර්කික පදනම පිළිබඳ තොරතුරු;

(ඇ) ණය හිමියාගේ වර්ගය ඇතුළුව ඉදිරිපත් කරන ලද ආණ්ඩුවේ ණය උපකරණයේ ප්‍රතිලබ්ධීන් සහ අදාළ ණය සේවාකරණයන්;

(ඈ) මුදල් ප්‍රමාණය ද ඇතුළුව පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය ව්‍යවසාය සහ වෙනත් යම් අස්ථිත්වයක් වෙත නිකුත් කරන ලද ආණ්ඩුවේ නොපිය වූ ණය ඇපකර ලැයිස්තුවක්;

(ඉ) නොපිය වූ ප්‍රමාණයන් ද ඇතුළුව උපණය ලැයිස්තුවක්;

(ඊ) කාර්යාලයේ විෂයපථය යටතේ වන නොපිය වූ සැපයුම්කරුගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් ඇතුළු ඒ ගිවිසුම්වල මූල්‍ය නියම;

(උ) ආණ්ඩුවේ යම් නොපිය වූ ණය සේවාකරණ පිළිබඳ තොරතුරු; සහ

(ඌ) රාජ්‍ය ණය කළමනාකරණයට අදාළ වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් වාර්ෂික වාර්තා කෙටුම්පත සමාලෝචනය කොට, එය අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී අනුමත කරන ලද වාර්ෂික වාර්තාව පෙර මූල්‍ය වර්ෂයේ අවසානය පසුවී දින එකසිය අසූවක් ඉකුත් වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය. එකී අනුමත කරන ලද වාර්ෂික වාර්තාව මුදල් අමාත්‍යාංශයේ සහ කාර්යාලයේ නිල වෙබ් අඩවිවල පළ කරනු ලැබිය යුතු ය.

VII වන කොටස

## රාජ්‍ය ව්‍යවසායන් විසින් ණය ගැනීම සහ ඇපකර නිකුත් කිරීම සහ පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් විසින් වාර්තා කිරීම

රාජ්‍ය ව්‍යවසායන් විසින් ණයට ගැනීම සහ රාජ්‍ය ව්‍යවසායන් වෙත සහ රාජ්‍ය ව්‍යවසායන් විසින් ඇපකර නිකුත් කිරීම

**26.** (1) රාජ්‍ය ව්‍යවසායක් විසින් සිදු කරන යම් ණය සුරැකුම්පත් ප්‍රසිද්ධ නිකුතුවක් සහ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් අරමුදල් රැස්කිරීමක්, මූල්‍ය කළමනාකරණ වගකීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් ප්‍රකාර ණය ඌනකරණ අරමුණට අනුකූලව විය යුතු අතර, ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය අවශ්‍ය විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන අමාත්‍යවරයාගේ අනුමතය, ණය ඌනකරණ අරමුණ, වත්මන් සහ පුරෝකථනය කරන ලද රාජ්‍ය මූල්‍ය, මූල්‍ය සහ ණය වාතාවරණය මත පදනම් වූ යෝජිත ණය පිළිබඳ තක්සේරුවක් සමග විය යුතු අතර, තක්සේරු කිරීමේ නිර්ණායකය තක්සේරු කිරීමට අදාළ වන කාර්යපටිපාටිය සහ යම් වෙනත් කරුණු නියම කරනු ලබන පරිදි විය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ණය සුරැකුම්පත් ප්‍රසිද්ධ නිකුත් කිරීම සහ අරමුදල් රැස්කිරීම සඳහා අනුමතය ලබා ගැනීමේ කාර්යය සඳහා රාජ්‍ය ව්‍යවසායන් විසින් මේ එක් එක් සැලසුම් කළ ණය ගැනීම් සඳහා වන සියලු නියම සහ කොන්දේසි සහ ණය ලබා ගැනීම සිදු කළ පසුව ණය ගිවිසුමේ පිටපතක් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) රාජ්‍ය ව්‍යවසායක් වෙත සහ රාජ්‍ය ව්‍යවසායක් විසින් යම් ඇපකර නිකුත් කිරීමක් සිදු කිරීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය අවශ්‍ය විය යුතු ය.

රාජ්‍ය ව්‍යවසායන්ගේ වාර්තා කිරීමේ අවශ්‍යතා

**27.** රාජ්‍ය ව්‍යවසායක් විසින් එක් එක් කාර්තුව අවසාන වීමෙන් පසු දින හතලිස්පහක් ඉකුත් වීමට පෙර එහි නොපිය වූ ණය පිළිබඳ වාර්තාවක් කාර්යාලයට ඉදිරිපත් කළ යුතු අතර, 23 වන වගන්තිය යටතේ වන ඉල්ලීමක් මත, නියම කර ඇති පරිදි ඇපකරයකින් ආවරණය නොවූ ණය ද ඇතුළුව එහි මුළු නොපිය වූ ණය පිළිබඳ යම් තොරතුරු සහ දත්ත කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**28.** එක් එක් පළාත් සභාවක් සහ පළාත් පාලන ආයතනයක් විසින්, එක් එක් කාර්තුවක් අවසානයට පසු දින හතලිස්පහකට පසු නොවන දිනයක දී, ඇපකරයකින් ආවරණය නොවූ ණය ද ඇතුළුව එහි නොපිය වූ ණය පිළිබඳ වාර්තාවක් කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල වාර්තා කිරීමේ අවශ්‍යතා

VIII වන කොටස

**වැරදි සහ දඬුවම්**

**29.** (1) 2 වන වගන්තියේ සඳහන් සෑම අස්ථිත්වයක් විසින් ම මේ පනත මගින් නියම කර ඇති තොරතුරු කාර්යාලය විසින් නියම කරන ලද කාලසීමාව තුළ සහ ආකෘතියෙන් යුතුව කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

තොරතුරු සැපයීම සඳහා වන වගකීම

(2) (1) වන උපවගන්තිය යටතේ තොරතුරු සැපයීමට අවශ්‍ය වන්නා වූ ද, අස්ථිත්වයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම පවරා ඇත්තා වූ ද, 2 වන වගන්තියේ සඳහන් අස්ථිත්වයක යම් රජයේ නිලධරයකු හෝ පාලන මණ්ඩලයක් විසින්-

(අ) අසත්‍ය හෝ නොමඟ යවන සුලු යම් ප්‍රකාශයක් හෝ ප්‍රකාශනයක් සිදු කරනු ලබන හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ ඉදිරිපත් කළ යුතු හෝ ලබා දිය යුතු යම් ප්‍රකාශයක්, ප්‍රකාශනයක් හෝ තොරතුරක් සම්බන්ධයෙන් නොමඟ යවන සුලු තොරතුරු ලබා දෙන;

(ආ) කාර්යාලයේ කර්තව්‍ය සහ කාර්යවලට ප්‍රතිරෝධයක් දක්වනු ලබන හෝ ඒවා අවහිර කරනු ලබන; හෝ

(ඇ) තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් පවත්නා නීතියකින් වළක්වා නොමැති නම් හැර, නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාවක් තුළ යම් තොරතුරක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ද්‍රව්‍යයක් ලබා දීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන,

අවස්ථාවක දී, එවැනි රජයේ නිලධරයකු හෝ පාලන මණ්ඩලයක් වරදක් කරනු ලබන අතර, නිසි අධිකරණයක් විසින් වරදකට

වරදකරු කිරීමේ දී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතු ය.

වෙළඳපොළ සංවේදීතාව පිළිබඳ තොරතුරු ආරක්ෂා කිරීම

**30.** (1) ආණ්ඩුවේ ණය සුරැකුම්පත් නිකුත් කිරීම, වෙන් කිරීම හෝ ප්‍රතිමිල දී ගැනීමට අදාළ පරිපාලනමය ක්‍රියාවන්, ගිවිසුම්, එකඟතා හෝ ලේඛනවල අන්තර්ගත තොරතුරු අනාවරණය කිරීම මගින් ආණ්ඩුවේ සුබසිද්ධියට අවාසිදායක වන පාඩු හෝ තත්ත්වයන් නිර්මාණය විය හැකි අවස්ථාවක දී, වෙන් කිරීම සහ ප්‍රතිමිල දී ගැනීම සම්බන්ධයෙන් වන විට දී, වෙන්දේසියට හෝ අදාළ ගනුදෙනුවට පෙරාතුව තොරතුරු වෙළඳපොළ වෙත සපයන තෙක්, අදාළ පරිපාලනමය ක්‍රියාවන්, ගිවිසුම්, එකඟතා හෝ ලේඛන රහසිගත ලෙස ප්‍රකාශයට පත් කොට කාර්යාලයේ ආරක්ෂිතව තබනු ලැබිය හැකි ය. ඉන් ඉක්බිතිව ම, සියලු තොරතුරු ප්‍රසිද්ධියට පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ සහ එමගින් අපේක්ෂිත ක්‍රියාකාරකම් හෝ රාජ්‍ය ණය මෙහෙයුම් පිළිබඳ රහසිගත ස්වභාවයේ හෝ සාධාරණ ලෙස සැක කරනු ලැබිය යුතු තොරතුරු පිළිබඳව දැනගන්නා හෝ එකී තොරතුරුවලට ප්‍රවේශය ඇති යම් තැනැත්තකු, අපේක්ෂිත ක්‍රියාකාරකම් හෝ රාජ්‍ය ණය මෙහෙයුම්වලට පෙරාතුව එකී තොරතුරු දැනුම් දෙන ලෙසට නෛතික වගකීමකින් නියම කරනු ලබන තාක් දුරට හැර, එකී තොරතුරුවල රහසිගතභාවය පවත්වාගෙන යාමට බැඳී සිටින්නේ ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, නිසි අධිකරණයක් විසින් වරදට වරදකරු කරනු ලැබීමෙන් පසුව රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය

අනුයෝජිතයන් පත් කිරීමේ සහ විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීමේ බලය

**31.** (1) අමාත්‍යවරයා විසින්, යෝග්‍ය යයි සලකනු ලබන්නේ නම්, නිකුත් කිරීමේ අනුයෝජිතයන්, ක්‍රියායන අනුයෝජිතයන් සහ වෙනත් අනුයෝජිතයන් පත් කරනු ලැබිය හැකි අතර නියමිත පරිදි එම අනුයෝජිතයන් නියාමනය කිරීමට, අධීක්ෂණය කිරීමට සහ නිරීක්ෂණය කිරීමට කාර්යාලයට බලය තිබිය යුතු ය.

සැක දුරු කිරීම සඳහා, යම් නෛතික ආරාවුල් වෙනත් යම් රටක දී විභාග කොට නිරාකරණය කරනු ලැබිය හැකි අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට දී, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති බලයට, ක්‍රියායන අනුයෝජිතයන් පත් කිරීම ද ඇතුළත් වේ.

(2) ආණ්ඩුවේ ණය සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා අමාත්‍යවරයා විසින්, මහ බැංකුවේ නිර්දේශය සහිතව ප්‍රාථමික අලෙවිකරුවන් පත් කළ හැකි ය.

(3) ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීම කාර්යාලය විසින් උචිත යයි සලකනු ලබන යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු අතර, එයට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු ය:-

(අ) අස්ථිත්වයේ මූල්‍ය තත්ත්වය;

(ආ) මේ පනත මගින් හෝ ඒ යටතේ අස්ථිත්වය මත පනවනු ලබන කාර්ය ඉටු කිරීමට එය සතු පළපුරුද්ද සහ හැකියාව;

(ඇ) අස්ථිත්වයේ නෛතික සහ නියාමන අවශතාවලට අනුකූල වීම; සහ

(ඈ) මහජන යහපත.

(4) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් මේ පනත යටතේ අඛණ්ඩව ප්‍රාථමික අලෙවිකරුවන් විය යුතු අතර, මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවලට යටත් විය යුතු ය.

(5) (අ) (2) වන උපවගන්තිය යටතේ සහ (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය කිරීමේ, සුපරීක්ෂණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලය මහ බැංකුව සතු විය යුතු ය.

(ආ) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ ප්‍රාථමික

අලෙවිකරුවකු විසින් කරන ලද හෝ කරනු ලැබිය හැකි වැරදි නඩු විභාග කොට නඩු කටයුතු පවරනු ලැබ අදාළ ආඥාපනතත් යටතේ නිශ්චිතව දක්වන ලද එම දඬුවම්වලට ම යටත් විය යුතු අතර, එකී වැරදි සම්බන්ධයෙන් පවත්වාගෙන යන හෝ අනාගතයේ දී පවත්වාගෙන යනු ලබන යම් විමර්ශනයක්, විභාගයක් හෝ පවරන ලද හෝ පැවරීමට ඇති යම් සිවිල් නඩුවක්, නඩුකරයක් හෝ නඩුවක් අදාළ ආඥාපනත්වල විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, පවත්වාගෙන යාම, විභාග කිරීම හෝ තීරණය කිරීම කරනු ලැබිය යුතු ය.

(6) යම් ප්‍රාථමික අලෙවිකරුවකු විසින්, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් සිය කාර්යය ඉටු කිරීම නොතකා, ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් එම පත්වීම අවලංගු කිරීම හෝ අත්හිටුවීම සඳහා පදනමක් විය හැකි නෛතික සහ නියාමන අවශ්‍යතාවන් සමග ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අනනුකූලතාවය පිළිබඳ මහ බැංකුව විසින් අමාත්‍යවරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින්, ප්‍රාථමික අලෙවිකරුවන් පත් කිරීමේ කාර්ය සඳහා සහ මේ පනත යටතේ පත් කරනු ලබන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි, ඔවුන්ගේ වරප්‍රසාද සහ ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

(8) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ (420 වන අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා හෝ මහ බැංකුව හෝ මහ බැංකුවේ යම් නිලධරයකු විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද සහ පත් කරන ලද දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා හෝ බලාත්මකව පවත්නා සියලු රීති, නියෝග, විධාන, තීරණ, නියම, අනුමත කිරීම් හෝ ප්‍රතික්ෂේප කිරීම්, දැන්වීම්, චක්‍රලේඛ, මෙහෙයුම් උපදෙස්, ආචාර ධර්ම සංග්‍රහය හෝ වෙනත් යම් ලිඛිත සන්නිවේදන අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර, මේ පනත යටතේ පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන්ට අදාළ විය යුතු ය.

(9) අමාත්‍යවරයා විසින්, ගිවිස ගනු ලබන යම් නියම සහ කොන්දේසි මත, මේ පනත යටතේ ඔහුගේ කර්තව්‍ය නිසි පරිදි සහ ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, යම් වෘත්තිකයන්, උපදේශකයන් සහ විශේෂඥයන් කුලියට ගැනීම හෝ ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීම සිදු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම පත්කිරීම් සඳහා වූ පිරිවැයක් තිබේ නම්, එම පිරිවැය සහ වෘත්තිකයන්, උපදේශකයන් සහ විශේෂඥයන්ගේ සේවය ලබා ගැනීම සඳහා වන පිරිවැය, අදාළ විසර්ජන පනතේ ප්‍රතිපාදන තුළ තිබිය යුතු ය.

(10) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින්, අදාළ ලිඛිත නීතියකට අනුකූලව, විද්‍යුත් ක්‍රමයට සහතික රහිත සුරැකුම්පත් නිකුත් කිරීමට, හිමිකාරිත්වය ගබඩා කිරීමට, එම සුරැකුම්පත්වල හිමිකම සහ පොලිය වාර්තාගත කිරීමට සහ එම සුරැකුම්පත්වල ගනුදෙනු පියවීමට සුරැකුම්පත් තැන්පතු පද්ධතියක් නම් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි නම් කිරීමක් සිදු කරනු ලබන තෙක්, ආණ්ඩුව විසින් නිකුත් කරන ලද සුරැකුම්පත් සඳහා අදාළ නීති යටතේ මහ බැංකුව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරය අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

**32.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් 35 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නියෝග සෑදීම සඳහා ඔහු සතු බලය හැර, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කොන්දේසි, වෙන් කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව, මේ පනතින් අමාත්‍යවරයා වෙත පිරිනමන ලද යම් බලයක්, අවස්ථාවෝචිත පරිදි, භාණ්ඩාගාරයේ ලේකම්වරයා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා හෝ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය. පැවරීමේ බලය

**33.** ආණ්ඩුව, අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා ලිඛිතව බලය ලබා දී ඇති රාජ්‍ය නිලධරයකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින් නිකුත් කරන ලද හෝ ගිවිසුම්ගත කිරීමට හෝ එවැන්නක් සඳහා හෝ ඒ වෙනුවෙන් නිකුත් කිරීමට අරමුණු කරන ලද යම් ණය ගිවිසුමක, මූල්‍ය කල්බදු ගිවිසුමක, සැපයුම්කරුගේ ණය ගිවිසුමක, ව්‍යුත්පන්නයක හෝ යම් ඇපයක නියමයන් මගින් නොබැඳිය යුතු ය. අනවසර ගනුදෙනුවල ප්‍රතිඵල සහ ඒවා බැහැර කරන ආකාරය

නඩුවලින් ආරක්ෂා කිරීම

**34.** අවස්ථාවෝචිත පරිදි, භාණ්ඩාගාරයේ ලේකම්වරයා, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ කාර්යාලයේ යම් සේවානියුක්තයකු හෝ කමිටුවේ යම් සාමාජිකයකු විසින්, ඔහු සද්භාවයෙන් කටයුතු කළ බවත් සියලු නිසි උද්‍යෝගය, යුක්ති සහගත සැලකිලිමත්භාවය සහ නිපුණතාවය ක්‍රියාවට නැංවූ බවත් ඔප්පු කරන්නේ නම්, කාර්යාලය වෙනුවෙන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අදාළව සහ ඒවා සිදු කිරීමේ දී ඔහු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත හෝ කිරීම පැහැර හරින ලද යම් ක්‍රියාවක් සඳහා ඔහුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

නියෝග

**35.** (1) අමාත්‍යවරයා විසින්, කමිටුවේ නිර්දේශය මත, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට, නියම කරන ලද කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනතේ අරමුණු සහ විධිවිධාන බලාත්මක කිරීම පිණිස නියෝග සෑදීමට අවශ්‍ය කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී නියෝග පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබීමෙන් පසුව හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසුව එළඹෙන දිනයක දී බලාත්මක විය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එකී අනනුමතයේ දිනයේ සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් නියෝගයක් එසේ අනුමත නොකරන ලද දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව

**36.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් ලිඛිත නීතියක් අතර යම් අනනුකූලතාවක් හෝ ගැටුමක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ බලතල ව්‍යාප්තිය සීමා කිරීමෙන් තොරව, ණය ගැනීමට ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ගැනීම, නිකුත් කිරීමට, ණය ඇපකර, සැපයුම්කරුගේ ණය ගිවිසුම් සහ මූල්‍ය කල්බදු ගිවිසුම් සහ ආණ්ඩුවේ ණය සුරැකුම්පත් ප්‍රාථමික සහ

ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රාථමික අලෙවි නියෝජිතයන් පත් කිරීමට අමාත්‍යවරයා සතු අධිකාරි බලය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

කාර්යාලය ක්‍රියාත්මකවීම සඳහා වන අන්තර්කාලීන විධිවිධාන

**37.** නියමිත දින සිට මාස දහඅටක කාලසීමාවක් ඇතුළත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වන වගන්තිය අදාළ වීම ක්‍රියාත්මක විය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කාර්යාලය විසින්, මේ පනත යටතේ එහි බලතල සහ කර්තව්‍ය ඉටු කළ යුතු ය.

පවත්නා ණය ගැනීමේ සාධන පත්‍ර අදාළ වීම සඳහා වන වැඩපිළිවෙළ

**38.** නියමිත දිනයට පෙර නිකුත් වූ හෝ ඇතුළු කරන ලද ආණ්ඩුවේ ණය සුරැකුම්පත්, ණය ගිවිසුම්, මූල්‍ය කල්බදු ගිවිසුම්, සැපයුම්කරුගේ ණය ගිවිසුම්, ව්‍යුත්පන්න හෝ ඇපකර, මේ පනත බලාත්මක වූ නියමිත දින සිට මේ පනත යටතේ එළඹුණු හෝ නිකුත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**39.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"වාර්ෂික අයවැය ලේඛනය" යන්නෙන්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන අදාළ නීති ප්‍රකාරව සකසන ලද ලේඛනය අදහස් වන අතර, එය-

(අ) නියම කරනු ලැබිය හැකි ආකෘතිවලින් වූ ආදායම් සහ වියදම් තක්සේරුවලින්; සහ

(ආ) වෙනත් කරුණු අතර, වියදම් තක්සේරු සහ ණයට ගැනීමේ උපරිම සීමාවන් ඇතුළත් වන විසර්ජන පනත් කෙටුම්පතෙන්,

සමන්විත වේ;

"වෙනත් යම් අස්ථිත්වයක්" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ ද, ආණ්ඩුවේ ණය ඇපකර හෝ උපණය දෙන අරමුදල් ලබා ගැනීමට පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද්දා වූ ද, යම් අස්ථිත්වයක් අදහස් වේ;

"ණය ගැනීම" යන්නෙන්, ණය ගිවිසුම් ගතවීමෙන්, වාණිජ බැංකුවලින් අත්තිකාරම් මුදල් ලබා ගැනීමෙන් සහ ණය සුරැකුම්පත් නිකුත් කිරීමෙන් අරමුදල් රැස් කිරීම සඳහා වන කාර්යපටිපාටි අදහස් වන අතර, "ණය ගැනීම" යන්න ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"ණය" යන්නට, -

(i) ණය ගැනීමෙන්;

(ii) සැපයුම්කරුගේ ණය ගිවිසුම්වලට සහ මූල්‍ය කල්බදු ගිවිසුම්වලට එළඹීමෙන්;

(iii) ණය ගැනීම හැර වෙනත් යම් කාර්යයක් සඳහා ණය සුරැකුම්පත් නිකුත් කිරීම් මගින්; සහ

(iv) කැඳවනු ලැබ ඇති ඇපකරයක් මගින් ආවරණය වූ ණයක් යටතේ ගෙවීමට ඇති වන බැඳීම් මගින්,

උත්පාදනය වන සියලු මූල්‍ය වගකීම් ඇතුළත් වේ;

"ආණ්ඩුවේ ණය" යන්නෙන්, 2 වන වගන්තියේ (අ) සහ (ආ) ඡේදයන්හි සඳහන් අස්ථිත්වයන් මගින් ලබා ගන්නා ණය සහ ණය මගින් උත්පාදනය වන වගකීම් අදහස් වේ;

"ණය සුරැකුම්පත්" යන්නෙන්, නම් කළ තැනැත්තන්ට හෝ දරන්නා වෙත පවතින සාධන පත්‍ර වශයෙන් ඉලෙක්ට්‍රොනික (කඩදාසි භාවිතයෙන් තොර) ආකාරයෙන් හෝ ලේඛනයක් ලෙස නිකුත් කරන ලද ගනුදෙනු කළ හැකි හෝ ගනුදෙනු කළ නොහැකි සුරැකුම්පත් අදහස් වන අතර, ඊට භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර, පොරොන්දු නෝට්ටු, සහතික පත්‍ර, නෝට්ටු, වාණිජ ලේඛන හෝ ජනතාවගෙන් මුදල් රැස් කරන්නා වූ වෙනත් යම් සමාන සාධන පත්‍ර ද ඇතුළත් වේ;

"ව්‍යුත්පන්න" යන්නෙන්, ආණ්ඩුවේ ණය කලඹේ ඇතුළත් මූල්‍ය අවදානමට එරෙහි ආවරණයක් වශයෙන් භාවිත කරන උපකරණ අදහස් වන අතර, ඊට පොලී සහ ව්‍යවහාර මුදල් හුවමාරු හෝ යම් සමාන උපකරණයන් ද ඇතුළත් විය හැකි ය;

"මූල්‍ය කල්බදු ගිවිසුම්" යන්නෙන්, වත්කම පරිහරණය කරන්නා (බදු ගැනුම්කරු) විසින් එම වත්කමේ ගැනුම්කරු හෙවත් හිමිකරු (බදු දීමනාකරු) වෙත (බදු දීමනාකරුගේ මූල්‍යකරණ පිරිවැය සහ ලාභාන්තිකය ඇතුළුව) බදු දෙන ලද වත්කමේ සම්පූර්ණ පිරිවැය ආවරණය කරමින් බදු කුලී හෝ වාරික පෙළක් ගෙවනු ලබන සහ බද්ද අවසානයේ දී වත්කම ස්ථාවර මිලකට අත්කර ගැනීමේ විකල්පය සහිත දීර්ඝකාලීන මූල්‍ය සැලසුමක් අදහස් වේ;

"මූල්‍ය වර්ෂය" යන්නෙන්, ලිත් වර්ෂය අදහස් වේ;

"ආණ්ඩුව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අදහස් වේ;

"ඇපකරය" යන්නෙන්, යම් නිශ්චිත කොන්දේසි යටතේ වෙනත් නෛතික තැනැත්තකුගේ හෝ අස්ථීත්වයක ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් ඇප වීම සඳහා ඇපකරු වශයෙන් ආණ්ඩුව විසින් කරනු ලබන ප්‍රත්‍යක්ෂ පොරොන්දුවක් අදහස් වේ;

"ණය ඇපකරය" යන්නෙන්, ආණ්ඩුව ඇපකරු වශයෙන්, යම් විශේෂිත ණය ගැනීමක නියමයන් යටතේ ණයගැතියාගේ ගෙවීමේ වගකීමට යටත් වීමට භාර ගන්නා වූ ඇපකරයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, සියලු මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නියමිත" යන්නෙන්, නියෝග මගින් නියම කරනු ලබන යන්න අදහස් වේ;

"රාජ්‍ය ණය" යන්නෙන්, 2 වන වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කරන ලද අස්ථිත්වයන්හි ණය සහ ණය මගින් උත්පාදනය කරන ලද බැරකම් අදහස් වේ;

"ස්වෛරී ණයහිමියන්" යන්නෙන්, ශ්‍රී ලංකාව සමඟ රාජ්‍යතාන්ත්‍රික සහ වෙළඳ සම්බන්ධතා හෝ ද්විපාර්ශ්වික ගිවිසුම් ඇති සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් වන්නා වූ විදේශීය රටවල ආණ්ඩු අදහස් වේ;

"විශේෂ වියදම් කිරීමේ ඒකක" යන්නෙන්, අදාළ විසර්ජන පනතේ වැය ශීර්ෂයක් ලබා දී ඇති අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් හෝ පළාත් සභාවක් හැර, යම් අස්ථිත්වයක් අදහස් වේ;

"රාජ්‍ය ව්‍යවසායයන්" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ස්වකීය ව්‍යාපාරය පාර්ශ්වික වශයෙන් හෝ පූර්ණ වශයෙන් ණයට දීම හෝ ණයට ගැනීම වන්නා වූ ද රක්ෂණ සහ මූල්‍ය කල්බදුකරණ සමාගම් ඇතුළු මූල්‍ය ආයතන හැර-

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව රාජ්‍ය සංස්ථාවක්;

(ii) රජයට එහි කොටස් දැරීම ප්‍රකාරව ඍජු පාලන අයිතියක් පවතින 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවා මෙහෙයුම් කටයුතු කරගෙන යන්නා වූ අස්ථිත්වයක්; හෝ

(iii) 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ප්‍රකාරව හෝ යම් ව්‍යාපාර අස්ථිත්වයක් රජය වෙත පවරනු ලැබ ඇත්තේ යම් වෙනත් පනත්

යටතේ ද, එම වෙනත් පනත් ප්‍රකාරව පරිවර්තනය කරන ලද රජයට අයත් සංස්ථා,

අදහස් වේ;

"ව්‍යවස්ථාපිත අරමුදල්" යන්නෙන්, ඒකාබද්ධ අරමුදල හැර, යම් නිශ්චිත කාර්යයක් සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක් අදහස් වන අතර, සකසුරුවම්, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැඟීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවානියුක්තයන් විසින් දායක වන ලබන සුබසාධක අරමුදලක් හෝ අදාළ ලිඛිත නීතිය යටතේ සේවානියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හෝ මෙයට ඇතුළත් නොවේ.

**40.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.